පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.24 පැය 0800 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out / 824 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


## පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු

### 01. බලපත්‍ර නොමැතිව බුරුත කඳන් තොගයක් ප්‍රවාහනය කිරීමට සූදානම්ව සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ඉලුප්පුකඩවායි කඳවුර.

2025.04.23 වන දින උදෑසන කාලයේ ඉලුප්පුකඩවායි පොලිස් වසමේ මුල්ලිකුලම් රක්ෂිත ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා ඉලුප්පුකඩවායි කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැටලීමක් සිදුකර **බලපත්‍ර නොමැතිව බුරුත කඳන් තොගයක් ලොරි රථයකින් ප්‍රවාහනයට සූදානම් කර සිටි සැකකරුවෙකු බුරුත කඳන් 13 ක් හා ලොරි රථය ද සමග අත්අඩංගුවට** ගෙන ඉලුප්පුකඩවායි පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 20 ක් වන මන්නාරම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ඉලුප්පුකඩවායි පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

### 02. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ආරුගම්බේ කඳවුර.

2025.04.23 වන දින අළුයම් කාලයේ පොතුවිල් පොලිස් වසමේ ඌරණි ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා ආරුගම්බේ කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන පොතුවිල් පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**සැකකරු වයස අවුරුදු 52 ක් වන පොතුවිල් ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පොතුවිල් පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

### 03. ගංජා හේනක් වැටලීම - පොලිස් විශේෂ කාර්ය බලකා සියඹලාණ්ඩුව කඳවුර.

2025.04.23 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා සියඹලාණ්ඩුව කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් දඹගල්ල පොලිස් වසමේ බලගොල්ල කනත්ත රක්ෂිතයේ නීති විරෝධී ලෙස අක්කර ¾ ක පමණ භූමි ප්‍රමාණයක වගා කර තිබූ අඩි 06 ක් පමණ උස ගංජා ගස් 13885 ක් පමණ වූ ගංජා හේනක් වටලා එහි සාම්පල් ලෙස ලබා ගත් නඩු භාණ්ඩ දඹගල්ල පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

වැටලීම සිදුවන අවස්ථාවේ සැකකරුවන් කිසිවකු සිට නොමැති අතර ගංජා ශේන පවත්වාගෙන ගිය අයවලුන් අත්අඩංගුවට ගැනීම සඳහා දඹගල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 04. බලපත්‍ර නොමැතිව වැලි කැණීම් කල සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා සමන්තුරය කඳවුර.

2025.04.23 වන දින දහවල් කාලයේ සමන්තුරය පොලිස් වසමේ ගල්ඔය ගඟ ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා සමන්තුරය කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැටලීමක් සිදුකර **බලපත්‍ර නොමැතිව වැලි කැණීම් කර ලොරි රථයකට පටවමින් සිටි සැකකරුවෙකු ලොරි රථය ද සමග අත්අඩංගුවට** ගෙන සමන්තුරය පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස 38 ක් වන සමන්තුරය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සමන්තුරය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 05. බූස්ස බන්ධනාගාරයේ සිදුකළ සෝදිසි මෙහෙයුමකදී නීති විරෝධී උපකරණ අත්අඩංගුවට ගැනීම - පොලිස් විශේෂ කාර්ය බලකා බූස්ස කඳවුර.

2025.04.23 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා බූස්ස කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් බූස්ස බන්ධනාගාරයේ හදිසි සෝදිසි මෙහෙයුමක් සිදුකර **ජංගම දුරකථනයක්, චාජර් 02ක්, ඩේටා කේබල් 02ක්, සිම්පතක් ඇතුළු දේපල අත්අඩංගුවට** ගෙන බන්ධනාගාර පාලනාධිකාරිය වෙත ඉදිරිපත් කර ඇත.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**